2025

කාර්යය සාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

Performance Report





රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
அரசாங்கத் தொழிற்சாலைத் திணைக்களம்
DEPARTMENT OF GOVERNMENT FACTORY

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය - 310

අන්තර්ගතය **පිටු අංක**

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය
1.1. හැඳින්වීම 02
1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම,මෙහෙවර,අරමුණු 05
1.3 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් 06
1.4 තත්කාලීනව කරනු ලබන ප්‍රධාන නිෂ්පාදන කාර්යයන් හා ලබා දෙනු ලබන සේවාවන් 07
1.5 අප දෙපාර්තමේන්තුවේ සතුටුදායක සේවාලාභීන් 08
1.6 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය 09
1.7 2025 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය හා විශේෂ සේවාවන් 10

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 15

පරිච්ඡේදය 03 - වසරේ මූල්‍ය කාර්ය සාධනය
3.1 භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 17
3.1.1 කළ වැඩ අත්තාකාරම් ගිණුමේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 21
3.2 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය 26
3.3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්යය සාධනය 26
3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 26
3.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව 27

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක
4.1 දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 43

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය
5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 43
5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 43

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 44
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය / අතිරික්තයේ බලපෑම 44
6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වූ ආකාරය 45


පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 47

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තුවක් වශයෙන් 1849 වර්ෂයේ කොළඹ ගෑස් වීදියේ ආරම්භ කරන ලද රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව පසුකාලීනව එනම් 1928 වර්ෂයේ සිට කොලොන්නාව දෙමටගොඩ මාර්ගයේ ඛණිජ තෙල් සංකීර්ණය අසල පිහිටුවා ඇත.

ආරම්භක කාල සීමාවේදී මහා මාර්ග, පාලම්, වාරිමාර්ග, ගොඩනැගිලි ඉදිකිරීම් යනාදී යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දායක වී ඇති අතර විදේශීය ඉංජිනේරුවන් විසින් මෙම ආයතනය මෙහෙයවා ඇත.




1969 දක්වා මෙලෙස ක්‍රියාත්මක වූ රජයේ වැඩ දෙපාර්තමේන්තුව එමගින් ඉටු කළ මහාමාර්ග තැනීම, නඩත්තුව සහ ගොඩනැගිලි ඉදිකිරීම සහ නඩත්තුව යනාදී සිවිල් ඉංජිනේරුමය කාර්යයන් සඳහා මහාමාර්ග දෙපාර්තමේන්තුව හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවද, යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් ඉටු කිරීම සඳහා "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ද, 1971.01.10 දින ස්ථාපනය කර ඇත.



බොල්ගොඩ පාලම ඉදිරිපස පෙනුම
1938 ජනවාරි 20

එතැන් සිට විවිධ රජයේ ආයතන මෙහෙයවීම සඳහා අවශ්‍ය වූ යාන්ත්‍රික ඉංජිනේරුමය සහායක සේවාවන් සැපයීම සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ අත්තිකාරම් ගිණුම් ක්‍රමයක් යටතේ පවත්වාගෙන යනු ලැබේ.



කාලානුරූපීව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් හා පොදු පහසුකම් අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය සහ වර්තමානයේ **නිවාස,**

ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය

මේ වන විට ශ්‍රී ලංකාව තුළ ජල කළමනාකරණ දියදොරටු නිර්මාණය කර සවි කිරීමේ වෙළඳපොලෙහි ප්‍රමුඛස්ථානය රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙත හිමිව තිබේ. මෑතකදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නිම කරන ලද බොහෝ මහා පරිමාණ ජල ව්‍යාපෘතිවල ජල පාලන දියදොරටු සියල්ලම නිර්මාණය කර සවි කරන ලද්දේ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසිනි. වෙහෙරගල, දැදුරු ඔය, පේ ආරු, රාජාංගනය, තොණ්ඩමනාරු, අට්ටික්කාව සහ රඹකැන් ඔය ජලාශ ව්‍යාපෘතීන් මින් කිහිපයකි.



වැල්ලවත්ත පාලම
1939 අගෝස්තු 03

ඊට අමතරව පානීය ජලය ලබාදීම වෙනුවෙන් පිරිපහදු ටැංකි නිර්මාණය කර සවිකිරීම සිදු කරන ලදි. උක්ත භාණ්ඩ හා සේවා වලට අමතරව, මුදල් රෙගුලාසි මගින් හා විවිධ අණපනත් හා ගැසට් මගින් පැවරී ඇති උපදේශාත්මක කටයුතු හා අත්‍යාවශ්‍ය සේවා කටයුතු රැසක්ම ඉටු කරනු ලබයි.

රටතුළ යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ නිපුණ කාර්මික මහතුන්, උපාධිධාරීන් හා වරලත් ඉංජිනේරු මහතුන් බිහි කිරීමට අවශ්‍ය කාර්මික පුහුණු ලබාදෙන රජයේ ප්‍රමුඛතම ආයතනයකි.

යටතේ අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී.

තවද පුද්ගලික අංශ මගින් ඉටුකර ගැනීමට අපහසු හා අධි ආරක්ෂිත කලාපවල විවිධ වූ ඉදිකිරීම් සඳහා මෙන්ම රාජ්‍ය උත්සව වලට අවශ්‍ය ඉදි කිරීම් සඳහා මෙන්ම රාජ්‍ය උත්සවවලට ඉදි කිරීම් කටයුතුද රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන ප්‍රධානතම කාර්යයකි.


රජයේ කර්මාන්තශාලාව විසින් යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ කරනු ලබන නිෂ්පාදන සහ සේවා ඉටු කරනු ලබන්නේ භාණ්ඩාගාරයේ කළවැඩ අත්තිකාරම් සහ ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය යටතේ වන බැවින් මෙම දෙපාර්තමේන්තුව රාජ්‍ය අංශයේ වාණිජ කටයුතු මෙහෙයවන සුවිශේෂී දෙපාර්තමේනතුවක් වශයෙන් හැඳින්විය හැක.

නිෂ්පාදන සහ නඩත්තු කාර්යයන් සඳහා යොදවනු ලබන දෙපාර්තමේන්තුගත නිලධාරීන්ට සහ සේවක පිරිස් සඳහා වැටුප් ගෙවීමට මාසිකව රුපියල් මිලියන 12ක මුදලක් පාරිභෝගිකයින්ගෙන් උපයා ගත යුතු වේ. මේ සඳහා මහා භාණ්ඩාගාරය විසින් අරමුදල් සපයනු නොලැබේ.

ශ්‍රී ලංකා ජාතික තත්ව ප්‍රතිපත්තිය අනුව යමින් 2013 වර්ෂයේදී රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ISO 9001:2008 ජාත්‍යන්තර තත්ත්ව පද්ධති සහතිකය දිනා ගැනීමට සමත් විය. මෙම සහතිකය උපයා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග තුලින් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීමට හැකි වූ අතර 2025 වර්ෂය තුලදී ISO

9001:2015 ජාත්‍යන්තර තත්ත්ව පද්ධති සහතිකය 2026 දක්වා යාවත්කාලීන කරන ලදී.

ඊට අමතරව CIDA ආයතනයේ ඉදිකිරීම් වෙනුවෙන් EM1 (Heavy Steel Fabrication) 2026 දක්වා අලුත් කරන ලදි. EMF (Elevators, Escalators & Revelators) 2026 දක්වා අලුත් කරන ලදි. SP2 (Carpentry & Joinery) 2026 දක්වා අලුත් කරන ලදි. TVEC යටතේ වැද්දුම් ශිල්පය හා වාත්තු තාක්ෂණ පාඨමාලා සඳහා ලියාපදිංචි වීම. මේ මගින් අප විසින් ඉටු කරන පාරිභෝගික සේවා වල වර්ධනයක්ද ඇති කිරීමට හැකියාව ලැබී ඇත.



තෝප්පුව පාලම
1938 ඔක්තෝම්බර් 24

1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රගතිය සඳහා යාන්ත්‍රික ඉංජිනේරු සේවා සහ විසඳුම් ලබා දීමේ ප්‍රමුඛයා වීම.

මෙහෙවර

ශ්‍රී ලංකාවේ කාර්මික සහ ආර්ථික වර්ධනයට දායක වෙමින් නවෝත්පාදන, නිපුණතා සංවර්ධනය සහ පාරිභෝගික ප්‍රමුඛතාවය තුළින් උසස් තත්ත්වයේ යාන්ත්‍රික ඉංජිනේරුමය සහ නිෂ්පාදන විසඳුම් ලබා දීම.

1.3 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

(අ) නිෂ්පාදන ක්ෂේත්‍රය

රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් සඳහා ලෝහමය, දැවමය භාණ්ඩ නිර්මාණය හා නිෂ්පාදනය

1. වාරිමාර්ග ජල කළමනාකරණ දිය දොරටු හා උපකරණ, ආරෝග්‍යශාලා උපකරණ.
2. දැව ගෘහ භාණ්ඩ දැව භාණ්ඩ.
3. වීනචිවට්ටි හා නිෙරස් වාත්තු.
4. පොලිස් දෙපාර්තමේන්තුව සඳහා නිල පටි, තරු, අංක තහඩු නිෂ්පාදනය කිරීම.
5. තැපැල් දෙපාර්තමේන්තුව හා වෙනත් දෙපාර්තමේන්තු සඳහා දින මුද්‍රා හා ඒ සඳහා අවශ්‍ය වන කැට නිෂ්පාදනය.
6. නාම පුවරු.

(ආ) ඉදිකිරීම් ක්ෂේත්‍රය (බර වැද්දුම්)

1. වාරිමාර්ග ජලාශ සඳහා විවිධ වර්ග වල ජල පාලන දිය දොරටු නිර්මාණය, නිෂ්පාදනය සහ සවි කිරීම.
2. පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති විහාරස්ථාන සහ බුද්ධ ප්‍රතිමා සඳහා ආරක්ෂක වැටවල් සහ ආරක්ෂිත වහල ඉදිකිරීම.
3. යකඩ සැකිළි මත ඉදි වූ ගොඩනැගිලි සෑදීම.
4. ගොඩනැගිලිවල දැව සහ ලෝහමය වහල ඉදි කිරීම.
5. රාජ්‍ය උත්සව, දේශිය හා විදේශිය රාජ්‍ය නායකයින්, විශේෂ ආරාධිත අමුත්තන් පිළිගන්නා උත්සව සඳහා හිරු ආවරණ, වේදිකා, කුටි ඉදි කිරීම.
6. යකඩ පාලම් ඉදිකිරීම.
7. ජල පවිත්‍රාගාර ටැංකි නිර්මාණය හා සවිකිරීම.

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

(ඇ) අලුත්වැඩියා සහ නඩත්තු ක්ෂේත්‍රය

1. ආරෝග්‍යශාලා, ආයුර්වේද, රෝහල්, බන්ධනාගාර, ලුහු කර්මාන්ත ආදී ආයතනවල යන්ත්‍රෝපකරණ නඩත්තුව හා අලුත්වැඩියාව.
2. වාරිමාර්ග හා ගොවිජනසේවා දෙපාර්තමේන්තු වල හා අනෙකුත් ආයතනවල ජල කළමනාකරණ දිය දොරටු සහ උපාංග නඩත්තුව හා අලුත්වැඩියාව.
3. කාර්යාල වල දැව භාණ්ඩ නඩත්තුව හා අලුත්වැඩියාව.
4. යතුරු ලියන හා වායු සමීකරණ යන්ත්‍ර නඩත්තුව හා අලුත්වැඩියාව.
5. රාජ්‍ය ආයතනවල වාහන සේවා කිරීම.

(ඈ) යාන්ත්‍රික ඉංජිනේරු උපදේශාත්මක සේවා

1. පශ්චාත් ඉංජිනේරු හා ඉංජිනේරු උපාධි අපේක්ෂකයින්, විවිධ පුහුණු ආයතනවල ආධුනිකයින් සඳහා ආයතනික ප්‍රායෝගික පුහුණුව ලබා දීම.
2. රාජ්‍ය ආයතනවල අලුත්වැඩියා කළ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා තත්ත්ව වාර්තා ලබා දීම.
3. රාජ්‍ය ආයතනවල තාක්ෂණික ඇගයීම් කමිටු, අපහරණ කමිටු හා තක්සේරු කමිටු සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
4. යාන්ත්‍රික ඉංජිනේරුමය නිෂ්පාදනය හා සේවා සහ උපදේශක සේවා සැපයීම.


1.4 තත්කාලීනව කරනු ලබන ප්‍රධාන නිෂ්පාදන කාර්යයන් හා ලබා දෙනු ලබන සේවාවන්

අංකය	ආයතනය	සපයනු ලබන සේවාවන්
01.	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	අරිය දිය දොරටු හා අනෙකුත් වීනච්චට්ටි, දැව හා යකඩ ජලනල දිය දොරටු හා උපාංග නිර්මාණය හා සවි කිරීම.
02.	රෝහල්	රෝහල් පවුඩර් කෝට්න් කරන ලද හා සුදුයකඩින් නිෂ්පාදිත ගෘහ උපකරණ
03.	පොලිස් දෙපාර්තමේන්තුව/ ආරක්ෂක අමාත්‍යාංශය	නිල පටි, නාම පුවරු, යාන්ත්‍රික සයිරන් නලා, නිල අංක තහඩු ද්විත්ව ඇඳන්
04.	තැපැල් දෙපාර්තමේන්තුව	වර්ෂ, මාස හා දින කැට ඇතුළත් තැපැල් මුද්‍රා, ගෘහ උපකරණ, මෙවලම් නිෂ්පාදනය සහ යකඩ හා දැව ආශ්‍රිත නිමැවුම්
05.	දුම්රිය දෙපාර්තමේන්තුව	වාත්තු හා යකඩමය නිෂ්පාදනයන්
06.	පුනරුත්ථාපන/ ආයුර්වේද රෝහල්	යන්ත්‍රෝපකරණ සවි කිරීම සහ නඩත්තුව
07.	මාර්ග සංවර්ධන අධිකාරිය	මාර්ග බාධක හා සංඥා පුවරු, මෑන් හෝල් සැකිලි හා පියන්, යකඩ පාලම්
08	ජල සම්පාදන, ජල ප්‍රවාහන මණ්ඩලය	ජල පවිත්‍රාගාර ටැංකි ඉදිකිරීම / සවි කිරීම / අළුත්වැඩියාව
09.	මැතිවරණ දෙපාර්තමේන්තුව	ඡන්ද පෙට්ටි සෑදීම, ගෘහ උපකරණ සැපයීම
10.	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	කාමර වෙන් කිරීම්, වහල අළුත්වැඩියා, වැසි අංක හා එන්ජින් අංක මුද්‍රණය
11	සියළුම රාජ්‍ය / පෞද්ගලික ආයතන	දැවමය ගෘහ භාණ්ඩ හා අනෙකුත් දැව නිෂ්පාදිතයන්
		ස්ක්‍රීන් මුද්‍රණ, ඩිජිටල් මුද්‍රණ, දැන්වීම් පුවරු, කැටයම් වැඩ, එන්ගේව් (සැරිම)
		එම්බෝස් (ඉලිප්පුම් වැඩ) , රාජ්‍ය ලාංඡන
		දොර හා ජනෙල් නිෂ්පාදනය, බිත්ති පනේල (කැටයම්) කිරීම, පාටිෂන් කිරීම (ඇලුමිනියම් හා දැව)
		කැපීම, සිදුරු කිරීම, එතීම, හිල් විදීම (ඩ්‍රිල් කිරීම) වෑල්ඩින් සහ කම්මල් වැඩ, සියළුම යාන්ත්‍රණ වැඩ Planning, CNC, Milling
		විශාල පිරිසැකසුම් වැඩ , සැහැල්ලු පිරිසැකසුම් වැඩ හා කම්මල් වැඩ හා ඇලුමිනියම් පිරිසැකසුම් වැඩ.
		විදුලි වැඩ, Control Panel Board නිර්මාණය හා සෑදීම විදුලි ස්ථාපනයන් හා අලුත්වැඩියාවන්
		ඉලෙක්ට්‍රෝ ප්ලේටින් (විද්‍යුත් ලෝහාලේපනය) Powder coating කිරීම.
12.	වරලත් ඉංජිනේරු, ඉංජිනේරු උපාධි අපේක්ෂකයින්, විවිධ තාක්ෂණික පුහුණු ආයතන	යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රායෝගික පුහුණුව ලබාදීම

1.5 අප දෙපාර්තමේන්තුවේ සතුටුදායක සේවාලාභීන්

අංකය	ආයතනය	ලබා දුන් සේවාවන්
01	ක්‍රීඩා අමාත්‍යාංශය	දැවමය උළුවහු හා දොර ජනෙල් සෑදීම
02	මහා භාණ්ඩාගාරය	දැවමය උළුවහු හා දොර ජනෙල් සෑදීම
03	මැතිවරණ දෙපාර්තමේන්තුව	ඡන්ද පෙට්ටි සෑදීම, අළුත්වැඩියාව හා නාම පුවරු සැකසීම
04	ගල්ගූර් ගොඩනැගිල්ල - කොළඹ 01	දැවමය උළුවහු හා දොර ජනෙල් සෑදීම
05	ජනාධිපති මන්දිරය (අනුරාධපුර / නුවරඑළිය)	දැවමය උළුවහු දොර ජනෙල් සහ වහලය අළුත් වැඩියාව හා නඩත්තුව
06	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	ජල පාලන දිය දොරටු හා උපාංග සැලසුම් කිරීම, නිෂ්පාදනය නඩත්තුව හා අළුත්වැඩියා කිරීම.
07	රජයේ රෝහල්	සියළුම රෝහල් ගෘහ උපකරණ (යකඩ සහ සුදුයකඩ) පව්ඩර් කෝටින් කිරීම හා අළුත්වැඩියා කිරීම.
08	පොලිස් දෙපාර්තමේන්තුව	නිල පටි, අංක තහඩු ගෘහ උපකරණ, තට්ටු ඇඳන් (දැව හා යකඩ)
09	තැපැල් දෙපාර්තමේන්තුව	වර්ෂ, මාස හා දින කැට ඇතුළත් තැපැල් මුද්‍රා, ගෘහ උපකරණ හා මෙවලම්, නාම පුවරු නිෂ්පාදනය හා යකඩ සැකිලි මත ගොඩනැගිලි ඉදි කිරීම.
10	අධිකරණ අමාත්‍යාංශය	දැවමය ගෘහ භාණ්ඩ, ලේඛණාගාර රාක්ක, නාම පුවරු
11	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව/ මධ්‍යම සංස්කෘතික අරමුදල	පුරා වස්තූන් සඳහා යකඩ වහළ නිර්මාණය, සෑදීම, සවි කිරීම, නාම පුවරු, කෞතුකාගාර ගෘහ භාණ්ඩ නිෂපාදනය, වීදි ලාම්පු කනු සදා සවි කිරීම.
12	දුම්රිය දෙපාර්තමේන්තුව	තිරිංග පලු හා දුම්රිය සංඥා සඳහා අවශ්‍ය භාණ්ඩ / උපකරණ
13	විදේශ කටයුතු අමාත්‍යාංශය	යකඩ හා දැවමය භාණ්ඩ / උපකරණ නඩත්තු කටයුතු සිදු කිරීම හා අළුත්වැඩියා කිරීම
14	මාර්ග සංවර්ධන අධිකාරිය/ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය	යකඩ පාලම් සෑදීම සහ සවිකිරීම, නාම පුවරු සැදීම.
15	ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය	ජල පවිත්‍රාගාර ටැංකි නිර්මාණය, සැදීම හා සවි කිරීම
16	ගුවන්තොටුපල හා ගුවන්සේවා සමාගම	Gantry පුටු Powder coat කිරීම, වීදුරු බිත්ති ආවරණය කිරීම සඳහා ආවරණ (Fender) සවි කිරීම.

1.6 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



ජෙ.යා.අ -	ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික අධිකාරී	ප්‍ර. සැ.ශි -	ප්‍රධාන සැලසුම් ශිල්පී	ජෙ.යා.අ.සැ -	ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික අධිකාරී (සැපයුම්)
සංව. නිල -	සංවර්ධන නිලධාරී	ජෙ.යා.අ.ආ -	ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික අධිකාරී (ආරක්ෂක)	යා.අධි -	යාන්ත්‍රික අධිකාරී
කා ග.ලිපි -	කාළගණක ලිපිකරු	පා.නි -	පාලන නිලධාරී	වැඩ.පරි -	වැඩ පරිපාලක
ප්‍ර.සමී.සහ -	ප්‍රමාණ සමීක්ෂණ සහකාර	වැඩ.ලිපි -	වැඩහල ලිපිකරු	අ.වැ ස -	අයවැය සහකාර
කළ සේ නි -	කළමණාකරණ සේවා නිලධාරී	අර්.ශිල්පී -	අර්ධ ශිල්පී	සු.සා.නි -	සුභසාධක නිලධාරී
කා.කා.ස -	කාර්යාල කාර්ය සහායක	වැ.හ සහ -	වැඩහල සහකාර	තො.ස.තානි -	තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිලධාරී

1.7 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය (2025.12.31 දිනට) - කළ වැඩ අත්තිකාරම්

	ව්‍යාපෘති විස්තර	ඉලක්කය 2025		ප්‍රගතිය 2025.12.31 දිනට	
		ඇස්තමේන්තුව (රු.මි.)	භෞතික (%)	ඇස්තමේන්තුව (රු.මි.)	භෞතික (%)
1	උෆව කුඩාඔය - උමා ඔය ව්‍යාපෘතියෙහි රේඩියල් ගේට්ටු අංක 02ක් සඳහා හයිඩ්‍රොලික් එසවීමේ යාන්ත්‍රණය සැකසීම සහ ස්ථාපනය කිරීම.	105	100	19.26	93
2	2025 ජාතික නිදහස් දිනය සඳහා VVIP, VIP වේදිකා සැකසීම, ස්ථාපනය කිරීම සහ ප්‍රවාහනය කිරීම	25	100	22.73	100
3	ඇල්ලේවැව වාත්තු යකඩ සොරොව් දොරටු හදිසි ගේට්ටුව සැකසීම, සැපයීම සහ ස්ථාපනය කිරීම	15	100	8.15	40
4	හපුගල ජල පවිත්‍රා ගාරය පැකේජ ආකාරයේ ජල පිරිපහදුවක් ඉදිකිරීම	80	100	-	5
5	තිස්සමහාරාමයේ ජල පවිත්‍රාගාරය ප්‍රතිසංස්කරණය කිරීම	28	100	5.83	65
6	යන්ත්‍රෝපකරණ ඒකකය (වැඩහල 01) - යන්ත්‍රෝපකරණ, පුද්ගලික සහ රාජ්‍ය අංශයේ වැඩ	6	100	14.08	100
7	බර වෑද්දුම් ඒකකය මඟින් ඉටු කරන අනෙකුත් කාර්යයන් (වැඩහල 02)	10	100	53.29	100
8	වඩු කාර්මික ඒකකය (වැඩහල් 03) (රාජ්‍ය සහ පෞද්ගලික අංශය සඳහා දැවමය ගෘහ භාණ්ඩ නිෂ්පාදනය)	15	100	4.05	37
9	සැහැල්ලු නිෂ්පාදන ඒකකය- (වැඩහල් 04) රෝහල් ගෘහභාණ්ඩ නිෂ්පාදනය සහ නඩත්තු කිරීම	15	100	43.67	100
10	වාත්තු ඒකකය - (වැඩහල් 06) රාජ්‍ය සහ පෞද්ගලික අංශය සඳහා යකඩ සහ යකඩ නොවන අයිතම වාත්තු කිරීම	25	100	25.97	100
11	සැහැල්ලු ඉංජිනේරු ඒකකය - (වැඩහල් 07) රාජ්‍ය සහ පෞද්ගලික අංශය සඳහා සැහැල්ලු ඉංජිනේරු කටයුතු	20	100	25.98	100
12	අලුත්වැඩියා /නඩත්තු ඒකකය මඟින් සිදු කරනු ලබන කාර්යයන් - (වැඩහල් 14 හා වැඩහල් 16)	6	100	6.95	100
	මුළු එකතුව	**350**	100	**229.96**	**70**

2025 වර්ෂයේ සිදු කරන ලද විශේෂ කාර්යයන් කිහිපයක් පහත පරිදි වේ.

01) අලුත්දිවුල් වැව ජලාශයේ ස්ථාපනය කිරීම සඳහා අපගේ වාත්තු ඒකකය සහ යන්ත්‍රාගාරය මගින් නිෂ්පාදනය කරන ලද සන ලෝහ (Cast Iron) ජලාශ ද්වාර, හදිසි ද්වාර සහ අදාළ අංග නිර්මාණය කර නිෂ්පාදනය කිරීම සහ සවි කිරීමට යොමු කිරීම.



02) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන් සමග අපි සිදුකරමින් සිටින කාර්මික සහයෝගීතා වැඩසටහනේ කොටසක් ලෙස, කැලණිය විශ්වවිද්‍යාලයේ පරිගණක හා තාක්ෂණ පීඨය සඳහා CNC යන්ත්‍ර පිළිබඳ ප්‍රායෝගික සැසියක් සංවිධානය කිරීම හා දේශීය විශ්ව විද්‍යාල සමග ඒකාබද්ධ වෙමින් පර්යේෂණ හා සංවර්ධන කටයුතු වැඩි දියුණු කිරීම.



03) කාර්මික සංවර්ධන මණ්ඩලය සමග ඒකාබද්ධව Ductile iron නිෂ්පාදනය පිළිබඳ ප්‍රායෝගික පුහුණු සැසියක් පැවැත්වීම තුළින් Ductile iron නිෂ්පාදන සඳහාද යොමු වීම.




04) කරාපිටිය රෝහල ඇතුළු රෝහල් සඳහා රෝහල් උපකරණ නිෂ්පාදනය



05) ගිරිඋල්ල පාලම අලුත්වැඩියා කිරීම



06) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත දුම්රිය අමතර කොටස් නිශ්පාදන කිරීම



නව තාක්ෂණය භාවිතය

අපගේ නිශ්පාදන ක්‍රියාවලිය නවීකරණය කිරීම සඳහා නවීන තාක්ෂණය සහිත විදුලි ලේසර් වෙල්ඩින් යන්ත්‍රය, 3D මුද්‍රණ යන්ත්‍රය හා නවීන ප්‍රේරක උදුන - Induction Furnace යොදා ගැනීම



3D මුද්‍රණ යන්ත්‍රය



විදුලි ලේසර් වෙල්ඩින් යන්ත්‍රය



Jolt squeeze molding machine

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2025 වසරේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ලබාගත් ජයග්‍රහණ හා මුහුණු දුන් අභියෝග

විශේෂ ජයග්‍රහණ

* "A Novel, Movable, Safer Chopping Machine to Produce Compost" යන නව නිපැයුම සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීම
* 2025 වර්ෂය තුළදී ISO 9001:2015 ජාත්‍යන්තර තත්ත්ව පද්ධති සහතිකය යාවත්කාලීන කරන ලදී. ඊට අමතරව CIDA ආයතනයේ ඉදිකිරීම් වෙනුවෙන් EMI (Heavy Steel Fabrication) 2025 වර්ෂයේදී අලුත් කරන ලදි. EMF (Elevators, Escalators & Revelators) 2025 වර්ෂයේදී අලුත් කරන ලදි. SP2 Carpentry & Joinery) 2025 වර්ෂයේදී අලුත් කරන ලදි.
* පුද්ගලික ආයතන සමඟ තරඟකර ජල පාලන දොරටු අවම මිළ ගණන් යටතේ සාදා සවිකිරීමට හැකිවීම.
* පාරම්පරික නිශ්පාදන යන්ත්‍ර වෙනුවට නවීන තාක්ෂණය සහිත යන්ත්‍ර සූත්‍ර මිලදීගෙන කාර්යක්ෂම හා උසස් ප්‍රමිතියෙන් යුත් ද්‍රව්‍ය සැකසීමට කටයුතු කිරීම.
* විශේෂයෙන් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙතින් තරඟකාරී ටෙන්ඩර් රාශියක් දිනා ගැනීම.
* පර්යේෂණ සහ සංවර්ධන කටයුතු දියුණු කිරීම සහ පුහුණු ඒකකය මගින් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම.

අභියෝග

* තාක්ෂණික හා කාර්යාලීය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු දිගින් දිගටම පැවතීම හා විශ්‍රාම ගැනීම හා විදේශගතවන සේවකයන් සඳහා බඳවා ගැනීම අභියෝගයක්ව පවතින පසුබිමක දෙපාර්තමේන්තුවේ තාක්ෂණික හැකියාවන් ගිලිහී යාම.
* සම්පූර්ණ කරන ලද කාර්යයන් සඳහා රාජ්‍ය ආයතනවලින් ලැබීමට නියමිත මුදල් නියමිත කාලවකවානු තුළ නොලැබීම.
* රාජ්‍ය ප්‍රතිපත්ති මත ප්‍රසම්පාදන ක්‍රියාවලින්ට අනුගතව කටයුතු කිරීමට සිදුවීම මත පුද්ගලික ආයතන සමඟ තරඟකාරී ලෙස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යාම දුෂ්කර වීම.
* රාජ්‍ය අංශය තුළ තිබිය යුතු අත්‍යවශ්‍ය ය තාක්ෂණික නිපුණතාවයන් පවත්වා ගනිමින් වාරි ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය තාක්ෂණික පිරිවිතර හා නිර්මාණ අදාල ආයතන වලට ලබා දුන්නද එම තොරතුරු භාවිතයෙන් එම ආයතන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ සැපයුම්කරුවන් සොයා ගැනීමට පෙළඹීම. මේ හේතුවෙන් අදාල නිපුණතාවයන් පවත්වාගෙන යෑම අභියෝගයක්ව පවතින අතර එමගින් ඉදිරියේදී මෙවැනි සේවා ලබාදීම ගැටලු සහගත වීමේ අවදානමද පවතී.
* කාර්යසාධන බැඳුම්කර, ලංසු බැඳුම්කර හා වෙනත් බැඳුම්කර ඉදිරිපත් කිරීමට අපහසුවීම.

<u>ඉදිරි ඉලක්ක</u>

* දැනට ඇණවුම් ලැබීම ගිලිහී ගොස් ඇති වාරිමාර්ග දෙපාර්තමේන්තු ඇණවුම්, රෝහල් ගෘහ භාණ්ඩ ඇණවුම්, පොලිස්, තැපැල් දෙපාර්තමේන්තු ඇණවුම් නැවත ලබා ගැනීමට සාකච්ඡා කිරීම.
* මහාමාර්ග සම්බන්ධ ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන මෙවලම් විදේශයන්ගෙන් ගෙන්වීමෙන් තොරව දේශීයව නිෂ්පාදනය කර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
* සාමාන්‍ය මහජනතාව සඳහා අවශ්‍ය යාන්ත්‍රික හා දැවමය කාර්යන්වල නිෂ්පාදන හා සේවා ලබා දීමේ ක්‍රමවේදයක් ඇති කිරීම.
* රටේ වර්ථමාන අවශ්‍යතාවයට අනුව පුහුණු ආයතනයක් ස්ථාපිත කිරීම.
* නිශ්පාදන ධාරිතාව වැඩි කර ගැනීම සඳහා පුද්ගලික අංශ සම්බන්ධ කර ගැනීමට කටයුතු කිරීම.

පරිච්ඡේදය 03 - වසරේ මූල්‍ය කාර්ය සාධනය

3.1 භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

3.1.1. කළ වැඩ අත්තාකාරම් ගිණුමේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

3.2 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

3.3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්යය සාධනය

3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

3.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව

3.1 භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ජපයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

එෆ්සීඒ-එෆ්පී

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025		සටහන	තත්‍ය 2025 රු.	තත්‍ය 2024 රු.	
රු.					
-	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	1	0	0	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	0	0	එෆිජ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	0	0	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	0	0	
-	මුළු ආදායම් ලැබීම් (අ)		0	0	
-	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අග්‍රිම		306,167,186	338,687,744	එෆිජ-3
-	තැන්පතු		47,126,655	46,074,944	එෆිජ-4
-	අත්තිකාරම් ගිණුම්		565,831,569	510,897,796	එෆිජ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		0	0	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**919,125,410**	**895,660,485**	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**919,125,410**	**895,660,485**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		60,100,814	136,713,966	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) - (ඇ)		**859,024,596**	**758,946,519**	
	අඩුකළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
100,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	96,909,972	88,820,886	
77,000,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	65,321,546	61,858,082	එෆිජ-2(ii)
1,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	647,541	884,682	
-	පොළී ගෙවීම්	8	0	0	
36,000,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	35,165,055	2,016,780	
214,500,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**198,044,114**	**153,580,430**	
	මූලධන වියදම්				
38,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	28,410,077	36,300,000	
33,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	33,154,412	44,947,644	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	0	0	එෆිජ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	0	0	
2,000,000	හැකියා වර්ධනය	14	1,623,266	1,466,693	
2,000,000	වෙනත් මූලධන වියදම්	15	2,000,000	797,866.00	
75,500,000	මුළු මූලධන වියදම් (උ)		**65,187,755**	**83,512,202**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)				
	තැන්පතු ගෙවීම්		46,654,567	37,638,908	එෆිජ-4
	අත්තිකාරම් ගෙවීම්		520,609,054	434,644,445	එෆිජ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		0	0	
	මුළු ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**567,263,621**	**472,283,354**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**830,495,490**	**709,375,986**	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		28,529,106	49,570,533	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**28,529,106**	49,553,403	එෆිජ 7
	2024 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		**0**	17,130	එෆිජ 3

ඒසිඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

	සටහන	2025 රු.	තත්‍ය 2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	1,087,329,884	1,054,175,497
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	(331,085,678)	(285,863,163)
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	0	17,130
මූළු වත්කම්		756,244,206	768,329,464
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(363,031,088)	(317,336,486)
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		1,087,329,884	1,054,175,497
කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම	ඒසිඒ- 5/5(බී)	0	0
		0	0
සංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	31,945,410	31,473,323
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	0	17,130
මූළු වගකීම්		756,244,206	768,329,464

පිටු අංක 06 සිට 27 දක්වා ඒසිඒ 02 සිට ඒසිඒ 07 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 28 සිට35 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදු කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38(1) (ඇ)වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : ඉංජි. එල්. ඩී. කුමුදු ලාල්
තනතුර : ලේකම්
දිනය :2026.02.27

.....
ගණන්දීමේ නිලධාරි
නම : ඉංජි ඒ. විජේසිංහ
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
දිනය :2026.02.25

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : ඩබ්. එච්. සී. හිමාලි
දිනය : 2026.02.25

ඒකීය-සූ

2025දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

	කණ්ඩ	
	2025 රු.	2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල්‍ය බදු ලැබීම්		
භාණ්ඩ, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		
ලාභ		
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	63,950,987	35,147,211
අග්‍රිම ලැබීම්	306,167,186	338,687,744
අත්තිකාරම් අයකර ගැනීම්	565,729,312	510,493,270
තැන්පතු ලැබීම්	47,126,655	46,074,944
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	982,974,140	930,403,170
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූල්‍යාධාර පධිනාධි හා මෙහෙයුම් වියදම්	196,608,898	151,401,573
සංහාරාධාර සහ මාරුකිරීම්	647,541	884,682
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්,මූලධන මාරු කිරීම්,හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	32,033,343	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	75,162,712	85,678,131
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	60,100,813	136,713,966
අත්තිකාරම් ගෙවීම්	520,609,054	434,556,577
තැන්පතු ගෙවීම්	46,654,567	37,638,908
ආදායමෙන් ආපසු ලැබීම්	18,002,800	
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	949,819,728	846,873,838
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	33,154,412	83,529,332
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	0	0
ලාභාංශ	0	0
කිරීකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	0	0
උපලබ්ධිය අයකර ගැනීම්	0	0
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	0	0
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්		83,512,202
මූලධන වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	33,154,412	
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	33,154,412	83,512,202
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(33,154,412)	(83,512,202)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	0	17,130
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	0	0
විදේශීය ණය ගැනීම්	0	0
ප්‍රදානයන් ලැබීම්	0	0
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	0	0
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	0	0
විදේශීය ණය ආපසු ගෙවීම්	0	0
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	0	0
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	0	0
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)	0	17,130
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	0	0
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	0	17,130

ඇමුණුම -(i)

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය
(මූ.රෙ. 106 හා මූ.රෙ. 113 යටතේ වන පාඩු)
රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය: 310
වැඩසටහන් අංකය හා නාමය : 02, සංවර්ධන වැඩසටහන්

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම්/කපාහැරීම්/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

අගය			සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු		
රු	25,000.01	වැඩි		
	එකතුව			-

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
එකතුව		0

(ii) නවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය

අහය			සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු	1	20,050.00
රු	25,000.01	වැඩි	8	1,066,488.27
	එකතුව			1,086,538.27

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
වාහන අනතුරු	7	708,946.00
වෙනත් භාණ්ඩ සොරාගැනීම්	2	377,592.27
එකතුව		1,086,538.27

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	9
	ගණන - රු	1,086,538.22
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	0
	ගණන - රු	
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	0
	ගණන - රු	

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මූ.රෙ. 106 යටතේ වන හානි හා මූ.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූදල්) /කොමසාරිස් (මූදල්)
දිනය : 2026.02.

3.1.1. කළ වැඩ අත්තාකාරම් ගිණුමේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රජයේ කර්මාන්තශාලාව - කොලොන්නාව

කළ වැඩ අත්තිකාරම් ගිණුම - 2025

2025.12.31න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශය

	සටහන්	2025 රු. ශත	2024 රු. ශත
ආදායම	1	265,080,150.04	301,100,475.16
නිෂ්පාදන හා පොදු කාර්යය වියදම්	2	(209,542,432.90)	(273,258,377.82)
දළ ලාභය		55,537,717.14	27,842,097.34
වෙනත් ආදායම්	4	795,372.27	101,278.82
පරිපාලන වියදම්	3	(35,478,239.38)	(14,764,104.92)
වාර්ෂික ශුද්ධ ලාභය/අලාභය		**20,854,850.03**	**13,179,271.24**

රජයේ කර්මාන්තශාලාව - කොලොන්නාව

කළු වැඩ අත්තිකාරම් ගිණුම - 2025

2025.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශනය

	සටහන්	පිරිවැය	සමුච්චිත ක්ෂය	2025රු. ශුද්ධ අගය	2024 රු.
වත්කම්					
දිගුකල් ඉන්නවින වත්කම්					
යන්ත්‍ර හා පිරියන (නාව)	5	360,828,819.75	28,670,817.79	332,158,001.96	325,623,943.23
මෝටර් රථ වාහන	6	70,847,359.61	7,576,583.97	63,270,775.64	63,270,775.64
ලී බඩු හා කාර්යාල උපකරණ	7	11,584,620.38	6,901,499.35	4,683,121.03	4,344,588.59
		443,260,799.74	43,148,901.11	400,111,898.63	393,239,307.46
				-	-
දිගුකල් වත්කම්					
2025.12.31 තොගය	8			80,131,685.07	47,476,674.25
ණයගැතියෝ	9			608,966,406.02	574,183,874.63
ගෙවිය යුතු අත්තිකාරම් ගිණුම				27,502,220.59	17,812,118.44
නිෂ්පාදන විසර්ජන ගිණුම				-	
භාණ්ඩාගාර අනුමත අත්තිකාරම් ගිණුම				442,332,557.08	385,167,075.47
ලැබිය යුතු ලංසු තැන්පත්				266,414.24	222,209.12
				1,159,199,283.00	1,024,861,951.91
මුළු වත්කම				**1,559,311,181.63**	**1,418,101,259.37**
බැරකම්					
දිගුකල් වගකීම්					
අත්තිකාරම් ලැබීම්	11			90,081,185.72	44,806,180.19
ගෙවිය යුතු වැට				396,481,026.64	369,769,322.83
උපචිත වියදම්	12			380,814.97	890,402.28
ණයගැතියන්ගෙන් වැඩිපුර ලැබීම				14,031,641.37	13,738,660.50
ණැදුම්				-	
ගෙවිය යුතු ලංසු තැන්පත්				2,912,126.92	2,912,126.92
ලියන් ගිණුමෙන් මාරු කිරීම්				-	
නිෂ්පාදන විසර්ජන ගිණුම				35,000,000.00	2,000,000.00
මුළු වගකීම්				**538,886,795.62**	**434,116,692.72**
ශුද්ධ වත්කම්				**1,020,424,386.01**	**983,984,566.65**

රජයේ කර්මාන්තශාලාව - කොලොන්නාව කළ, වැඩ අත්තිකාරම් ගිණුම - 2025 2025.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශනය					
ශුද්ධ වත්කම් / ස්කන්ධය					
සම්මත වැය යටතේ දැරූ වියදම්				444,014,643.51	437,142,052.34
ක්ෂය සංචිත අරමුදලෙන් දැරූ වියදම්				1,682,923.97	1,682,923.97
සමුච්චිත ලාභය				292,883,594.90	271,302,800.01
සමුච්චිත ක්ෂය				281,843,223.63	273,856,790.32
මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය				**1,020,424,386.01**	**983,984,566.64**
				-	

ඒ.බී.එච්.සී. හිමාලි
ප්‍රධාන ගණකාධිකාරි
දිනය 2026/02/26

ඉංජි.ඒ. විජේසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
දිනය 2026/2/26

ඉංජි.එල්.සී.කුමුදු ලාල්
ලේකම්
දිනය 2026/02/27

කළු වැඩ අත්තිකාරම් ගිණුම - 2025

2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය

	සම්මත වැය යටතේ දැරූ වියදම්	ක්ෂය අරමුදලින් දැරූ වියදම්	සමුච්චිත ලාභය / අලාභය	සමුච්චිත ක්ෂය	මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය
	රු.	රු.	රු.	රු.	රු.
2024-01-01 දිනට ශේෂය	428,594,598.64	1,682,923.97	278,039,875.01	273,856,790.32	982,174,187.94
2024 වර්ෂයේ ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීම්					-
2024 වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම්	8,547,453.70				8,547,453.70
2024 වර්ෂයේ ක්ෂය					-
2024 වර්ෂයේ ස්ථාවර වත්කම් ඉවත් නිරීම					-
වර්ෂයේ ලාභය			13,179,271.24		13,179,271.24
පෙර වර්ෂ ගැලපුම්			(19,916,346.24)		(19,916,346.24)
2024-12-31 දිනට ශේෂය	437,142,052.34	1,682,923.97	271,302,800.01	273,856,790.32	983,984,566.64
				547,713,580.64	
2025 වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම්	6,872,591.17				6,872,591.17
පෙර වර්ෂ ගැලපුම්			725,944.86		725,944.86
2025 වර්ෂයේ ක්ෂය				7,986,433.31	7,986,433.31
රජය ආදායමට					-
ප්‍රවර්තන වර්ෂ ලාභය			20,854,850.03	-	20,854,850.03
2025-12-31 දිනට ශේෂය	**444,014,643.51**	**1,682,923.97**	**292,883,594.90**	**273,856,790.32**	**1,020,424,386.01**

රජයේ කර්මාන්තශාලාව - කොලොන්නාව
කළු වැඩ අත්තිකාරම් ගිණුම - 2025
2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2025 රු.	2024 රු.
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
බදුවලට පෙර ශුද්ධ ලාභය	**20,854,850.03**	13,179,271.24
ගැලපීම් :-		
ෂෙර වර්ෂ ගැලපීම්	725,944.86	(19,916,346.24)
වෙනත් ආදායම්	(795,372.27)	(101,278.82)
ක්ෂය	7,986,433.31	8,433,675.18
මාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය	**28,771,855.93**	1,595,321.36
මෙහෙයුම් වත්කම්වල වැඩිවීම/අඩුවීම		
වෙළඳ හා ගෙවියයුතු වෙනත් ගෙවීම්	104,770,102.90	60,395,202.21
තොග	(32,655,010.83)	43,665,039.36
වෙළඳ හා ලැබියයුතු වෙනත් ලැබීම්	(44,516,838.66)	(23,157,735.62)
මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**56,370,109.34**	82,497,827.31
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
වෙනත් ආදායම්	795,372.27	101,278.82
ස්ථාවර වත්කම් මිලදී ගැනීම්	(6,872,591.17)	(8,547,453.70)
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
සම්මත වැය යටතේ වෙන්කිරීම්	6,872,591.17	8,547,453.70
මුදල් හා මුදල් සමාන දැවල ශුද්ධ වැඩිවීම	**57,165,481.61**	82,599,106.13
ආරම්භක භාණ්ඩාගාර අනුමත අත්තිකාරම් ගිණුම	385,167,075.47	302,567,969.34
2025.12.31 දිනට භාණ්ඩාගාර අනුමත අත්තිකාරම් ගිණුමේ ශේෂය	**442,332,557.08**	385,167,075.47

3.2 වෙන් කරන ලද ප්‍රතිපාදන (පවතීනම්) උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය රු. 000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසන් ප්‍රතිපාදනය		
පුනරාවර්තන	216,000	214,500	198,044	92.32%
ප්‍රාග්ධන	74,000	75,500	65,188	86.34%

3.3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්යය සාධනය රු.000

පරිත්‍යාගය කළ අයතනය	පරිත්‍යාගයේ අරමුණ	පරිත්‍යාග මුදල
නැත	නැත	නැත

3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යය සාධනය රු.000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2025 දිනය භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2025 දිනට මූල්‍ය තත්වය වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	ස්ථාවර වත්කම් සමීක්ෂණය යටතේ ඉහත අයිතමවල සමීක්ෂණ කටයුතු සිදු කිරීමට පහසුකම් නොමැති නිසා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂයන් ලබාදිය නොහැක.	408,971	2026 වර්ෂය තුළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව හා මූල්‍ය තත්ව වාර්තාව සැසඳීම් කර ඇත.	100%
9152	**යන්ත්‍රෝපකරණ**		**365,980**		
	වාහන		**72,379**		
9153	**ඉඩම්**		**240,000**		
9160	**කෙරීගෙන යන වැඩ**		**-**		

3.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. }සීඒඊ/ඒ/පීඑස්/එෆ්එස්/02//2025/05 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date }2026 මැයි 27 දින

අධ්‍යක්ෂ ජනරාල්
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

ශීර්ෂය 310 - රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 310 - රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණු සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම හා වංචා වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිලිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර

පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිලිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිලිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධානී අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 අත්තිකාරම් ගෙවීම්

(අ) ගබඩා අත්තිකාරම් ගිණුම

i. මූ.රෙ. 501 ප්‍රකාරව ගබඩා අත්තිකාරම් ගිණුම පවත්වා ගනු ලබන්නේ ලාභ උපයන අදහසින් හෝ පාඩු අපේක්ෂාවෙන් නොවන අතර, භාණ්ඩ ගෙන එනු ලබන මිලට භාණ්ඩ තොගය ගණන් ගනු ලබයි. ඒවා මිලදී ගැනීමට ගබඩා කිරීමට හා මෙහෙයුම් කටයුතු සඳහා වන වියදම් ආවරණය වන පරිදි පිරිවැයට සියයට 10 ක් එකතු කර තොග නිකුත් කරනු ලබන බව 2025 වර්ෂයේ ගබඩා අත්තිකාරම් ගිණුමේ පෙරවදනෙහි දක්වා තිබුණි. වර්ෂයේ නිකුත් කිරීම් වලින් නිකුත් කිරීමේ පිරිවැය රු.65,264,395 ක මුදල හා රු.16,959,887 ක සේවක වියදම් හා සැපයුම් වියදම් අඩුකළ පසු රු.6,480,780 ක අතිරික්තයක් ගිණුම් මඟින් දක්වා තිබුණි.

ii. ගබඩා අත්තිකාරම් ගිණුමේ රු.6,480,780 ක ලාභය, කළ වැඩ අත්තිකාරම් ගිණුමට ගැලපීමේදී, ඉන්ධන හා ලිපි ද්‍රව්‍ය වැනි නිෂ්පාදන කටයුතු සඳහා සෘජුව සම්බන්ධ නොවන අයිතමයන් සම්බන්ධ පිරිවැයන්ද වෙන් කිරීමකින් තොරව සෘජු ද්‍රව්‍ය පිරිවැය යටතේම ගැලපුම් කර තිබීමෙන් නිෂ්පාදන පිරිවැය අඩුවෙන් දක්වා තිබුණි.

iii. සමාලෝචිත වර්ෂයේ ලැබීම් හා නිකුත් කිරීමේ ගිණුමේ වියදම ඉක්මවූ නිකුත් කිරීම් ශේෂය වූ රු.6,480,780 ක අගය ශේෂ පත්‍රයේ රු.6,762,410 ක් ලෙස රු.281,630 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) කළ වැඩ අත්තිකාරම් ගිණුම

i. සමාලෝචිත වර්ෂය සඳහා අපේක්ෂිත කාරක පාඩු ලෙස රු.35,000,000 ක් 1701 - "පාඩු සහ කපා හැරීම්" වැය විෂයය යටතේ හර කර තිබුණද, එම වර්ෂය අවසානයේ කළ වැඩ අත්තිකාරම් ගිණුම තුළින් රු.20,854,850 ක ලාභයක් වාර්තා වී තිබුණි. මෙය රු.55,854,850 කට වැඩි ප්‍රමාණයක විශාල විචලනයක් බැවින් කාරක පාඩු ඇස්තමේන්තු කිරීමේදී නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. 1701 වැය විෂයය යටතේ කරන ලද ප්‍රතිපාදන සඳහා කාර්තුමය වශයෙන් ලාභ අලාභ ගිණුම් පිළියෙල කර නොතිබීම, ප්‍රමාණවත් සාක්ෂි, ගණනය කිරීමේ පදනම් සහ අනුමැතින් ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් එම වියදම් ප්‍රතිපාදන සත්‍ය හා සාධාරණ ලෙස නහවුරු නොවුණි.

ii. කළ වැඩ අත්තිකාරම් ගිණුමට අදාළ ගිණුම් ප්‍රතිපත්ති අංක 4 අනුව ව්‍යාපෘතියක් සඳහා දරන සත්‍ය පිරිවැය, එම වර්ෂයේ පිරිවැටුම ලෙස හඳුනා ගන්නා බවට අනාවරණය කොට තිබුණද සත්‍ය පිරිවැය ඉක්මවා පිරිවැටුම හඳුනාගෙන තිබුණු බව නියැදි පරීක්ෂාවට අනුව අනාවරණය විය. ඒ අනුව ව්‍යාපෘති 11 ක සත්‍ය පිරිවැය රු.30,188,906 ක් වූ අතර ව්‍යාපෘති පිරිවැටුම ලෙස රු.51,019,136 ක් හඳුනාගෙන තිබුණි. ඒ හේතුවෙන් පිරිවැටුම රු.20,830,230 ක් අධි තක්සේරු වී තිබුණි.

iii. 2025 වර්ෂයේ ණයගැති උපලේඛනය තුළ දක්වා තිබූ ව්‍යාපෘති 06 කට අදාළ රු.14,068,763 ක ණයගැති ශේෂ, සමාලෝචිත වර්ෂයට අදාළ ව්‍යාපෘති පිරිවැය ලැයිස්තුවේ ඇතුළත්ව නොතිබුණි.

iv. රු.13,179,271 ක් වූ පෙර වර්ෂ ලාභය රාජ්‍ය ආදායමට බැර කිරීමේදී සමුච්චිත ලාභයෙන් ඉවත් කිරීම වෙනුවට පරිපාලන වියදම් යටතේ වියදමක් ලෙස සටහන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩි වී ලාභය අඩුවෙන් දක්වා තිබුණි.

v. වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු රු.1,840,111 ක ලංසු තැන්පත් වටිනාකම් වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් එම වටිනාකමෙන් සමාලෝචිත වර්ෂයේ වත්කම් අගය අඩු වී තිබුණු අතර වියදම් වැඩියෙන් දක්වා තිබුණි.

vi. ලංසු තැන්පත් ලැබීම ලෙස ගිණුම්ගත කළ යුතු රු.85,000 ක ලංසු කල්පිරීම් වටිනාකම, ආදායම් ලැබීම් ලෙස ගිණුම්ගත කොට තිබුණි.

vii. ගනුදෙනුකරුවකු වෙතින් 2019 වර්ෂයේ රඳවා ගත් රු.104,190 ක රැඳවුම් මුදල් ආපසු ගෙවීම් පරිපාලන වියදම් යටතේ ඇතුළත් කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වියදම් වැඩියෙන් දක්වා තිබුණි.

viii. නිෂ්පාදන ක්‍රියාවලියට සෘජුව සම්බන්ධ නොවන පරිපාලන වියදම් වන ලංසු තැන්පත් වියදම රු.1,840,111 ක් හා යකඩ අබලි ප්‍රවාහන වියදම් රු.17,364 ක් නිෂ්පාදන පිරිවැයට ඇතුළත් කර තිබීමෙන් නිෂ්පාදන පිරිවැය වැඩියෙන් හා දළ ලාභය අඩුවෙන් ගණනය කර තිබුණි.

ix. පූර්ව කාලපරිච්ඡේද වැරදි නිවැරදි කිරීම් පිණිස පෙර වර්ෂ ගැලපුම් යටතේ රු.725,945 ක් සමුච්චිත ලාභයට ගැලපුම් කර තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 54 වගන්තිය ප්‍රකාරව ඒ පිළිබඳ කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.

x. 2024 දෙසැම්බර් මස කළ වැඩ ගිණුමට ලැබුණු වැය ශීර්ෂ ලැබීම් රු.198,009 ක් සමාලෝචිත වර්ෂයේ ජනවාරි මස උපලබ්ධි වී තිබුණු අතර එම වටිනාකම් සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන පිරිවැයට ඇතුළත් කොට තිබුණි.

xi. දෙපාර්තමේන්තුවේ වැයශීර්ෂ ලැබීම් ලෙස බැංකු ගිණුමක් වෙත 2025 දෙසැම්බර් 15 සහ 29 යන දෙදින ලැබී තිබූ චෙක්පත් 02 ක එකතු වටිනාකම රු.5,989,592 ක් සමාලෝචිත වර්ෂයේ වැය ශීර්ෂ ලැබීම් ලෙස ගිණුම්ගත කොට නොතිබුණි.

xii. 2025 නොවැම්බර් 13 දින අධ්‍යක්ෂ ජනරාල්ගේ බැංකු ගිණුම වෙත වෙනත් බැංකු ගිණුමකින් වැය ශීර්ෂ ලැබීම් සඳහා රු.1,518,578 ක චෙක්පතක් නිකුත් කර තිබුණු නමුත් 2026 ජනවාරි 31 දින තෙක්ම ගෙවීමට ඉදිරිපත් කර නොතිබුණි. මෙම චෙක්පත සමාලෝචිත වර්ෂයේ වැය ශීර්ෂ ලැබීම් ලෙස නිෂ්පාදන පිරිවැයට ගැලපිය යුතුව තිබුණද එසේ සිදු කොට නොතිබුණි.

xiii. දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක ජල සම්පාදන මණ්ඩලයේ 2214 දරන ව්‍යාපෘතිය සඳහා කාර්යසාධන බැඳුම්කර වශයෙන් දෙපාර්තමේන්තු බැංකු ගිණුමේ තැන්පත් කළ රු.6,303,721 ක මුදල දෙපාර්තමේන්තුවේ වත්කමක් ලෙස දැක්වීම වෙනුවට පරිපාලන වියදමක් ලෙස දක්වා තිබුණි.

xiv. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 86 ඡේදය අනුව දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් ප්‍රයෝජනවත් ජීවිත කාලය, ක්ෂය අනුපාත, එකතු කිරීම්, බැහැර කිරීම් හා සමුච්චිත ක්ෂය හෙළිදරව් කිරීම් කළ යුතු බවට දක්වා තිබුණද එසේ ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදු කොට නොතිබුණි.

xv. ස්ථාවර වත්කම් සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ගණනය කරන ලද රු.7,986,433 ක වාර්ෂික ක්ෂය වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඒ ඒ වත්කම් වලින් සමුච්චිත ක්ෂය වටිනාකමට එකතු කර වත්කම්වල පිරිවැය වටිනාකමෙන් අඩු කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ අගය පෙන්විය යුතු වුවද, එසේ නොකිරීම හේතුවෙන් වත්කම්වල ශුද්ධ අගය නිවැරදිව දක්වා නොතිබුණි. තවද, සාවද්‍ය ලෙස ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ රු.281,843,223 ක සමුච්චිත ක්ෂය වෙන් කිරීම් ඇතුළත් කර තිබුණි.

xvi. ජර්නල් සටහන් 117 හි දක්වා තිබුණු රු.338,532 ක ලි බඩු මිලට ගැනීම්, මෝටර් වාහන පිරිවැයටත් එහි සමුච්චිත ක්ෂය, ලි බඩු සමුච්චිත ක්ෂය වටිනාකමටත් අනුචිත ලෙස ගලපා තිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබූ ලි බඩු හා මෝටර් වාහන අගය නිවැරදි බව නිරීක්ෂණය නොවීය.

xvii. 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව 2008 හා 2009 වර්ෂවල පැවති ණයගැනි ශේෂ වල එකතුව රු.36,941,553 ක් වූවද ලියා හැරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිත කමිටු වාර්තාව ප්‍රකාරව එම ණයගැතියන්ගේ එකතුව රු.4,045,992 ක් විය. එසේ තිබියදී මූල්‍ය ප්‍රකාශයන්හි 2008 හා 2009 වර්ෂයට අදාළ ඉහත සඳහන් රු.36,941,553 ක් වූ මුළු ශේෂයම කපාහැර තිබුණි.

1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

ක්ෂය සංචිත අරමුදල වූ රු.1,682,924 ට අදාළව විස්තරාත්මක ඵලදායීතා හා රු.608,966,406 ක් වූ ණයගැති ශේෂය සඳහා ශේෂ සනාථන සහතික විගණනයට ඉදිරිපත් නොවීය.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
i. හානිපාඩු ලේඛනය	මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන	යාවත්කාලීන කර නොතිබුණි.
ii. බැරකම් පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 445 හි විධිවිධාන	-එම-
iii. තොග ලේඛන	මුදල් රෙගුලාසි 751 හි විධිවිධාන	-එම-
iv. වැය ලෙජරය	මුදල් රෙගුලාසි 447 හි විධිවිධාන	-එම-
v. පොදු තැන්පත් ලෙජරය	මුදල් රෙගුලාසි 565(1) හි විධිවිධාන	-එම-

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට සහ

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොනිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.3 (උ)	2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශනය අනුව 2008 හා 2009 වර්ෂවල පැවති ණයගැති ශේෂ වල එකතුව රු.36,941,553 ක් වුවද ලියා හැරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිත කමිටු වාර්තාව ප්‍රකාරව එම ණයගැතියන්ගේ එකතුව රු.4,045,992 ක් විය. එසේ නිබියදී මූල්‍ය ප්‍රකාශයන්හි 2008 හා 2009 වර්ෂයට අදාළ ඉහත සඳහන් රු.36,941,553 ක් වූ මුළු ශේෂයම කපාහැර තිබුණි.	1.6.1 (ආ)(xvii)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිසි අධ්‍යනයකින් හා සැලැස්මකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් වැය විෂයයන් 01 ක සියයට 98 ක් හා වැය විෂයයන් 04 ක සියයට 40 සිට සියයට 53 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුව තිබුණි.

(ආ) වැය විෂයයන් 05 ක් සම්බන්ධයෙන් වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන උපයෝජනයෙන් පසුව වූ ඉතිරිවීම් සම්බන්ධයෙන් දක්වා තිබූ හේතූන් නිවැරදි නොවූ බැවින් පිළිගත හැකි තත්ත්වයේ නොතිබුණි.

3.2 සීමා ඉක්මවීම්

2025 දෙසැම්බර් 29 දින අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලද 2025 දෙසැම්බර් 03 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 25/2476/827/006 හා 25/2373/827/002 මගින් සංශෝධනය කරන ලද කළ වැඩ අත්තිකාරම් ගිණුමේ සහ ගබඩා අත්තිකාරම් ගිණුමේ ලැබීම් වල අවම සීමාවන් පිළිවෙලින් රු.325,000,000 ක් සහ රු.60,000,000 ක් වුවත් ඒසිඒ - 05 ආකෘතියේ පිළිවෙලින් රු.450,000,000 ක් සහ රු.120,000,000 ක් ලෙස සංශෝධනයට පෙර වූ විසර්ජන පනතින් අනුමත කළ ප්‍රමාණයන් දක්වා තිබුණි.

3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) මූල්‍ය ප්‍රකාශනයෙහි බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි බැරකම් වාර්තා කර නොතිබුණද රු.4,408,366 ක අගයකින් සමාලෝචිත වර්ෂය අවසානයේ බැරකම් වලට එළඹ තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 94(1) රෙගුලාසිය ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට නොබැඳි සිටිය යුතු බව දක්වා ඇතත් නිසි අධ්‍යනයකින් හා සැලසුමකින් තොරව ඇස්තමේන්තු සැකසීම නිසා වැය විෂයන් 05 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉක්මවා රු.1,630,993 ක් බැරකම් වලට එළඹ තිබුණි.

3.4 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති , රීති හා රෙගුලාසි විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආයතන සංග්‍රහය xix පරිච්ඡේදයේ 6.4 ඡේදය	සංහිඳ සෙවණ මහල් නිවාස සංකීර්ණයේ නිවාස 60 කින් යුත් මහල් 06 ක් පරීක්ෂා කිරීමේදී නිවාස වසා දැමීම නිසා නිවාස 33 ක් පරීක්ෂා කර නොතිබූ අතර පරීක්ෂා කළ නිවාස 27 න් නිවාස 06 ක් කුලියට ලබා දී ඇති බව නිවාස පරීක්ෂණ මණ්ඩලය වාර්තා කර තිබුණි. නිවාස අතුරු බද්දට දීම, මුදල් ගෙවා නවතින අමුත්තන් සහ නේවාසිකයන් නබා ගැනීමද තහනම් බව අදාළ රෙගුලාසියේ දක්වා ඇතත් නිවාස කුලියට ලබා දී තිබූ නිලධාරීන් අතරින් නිලධාරීන් තිදෙනෙකු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිවාස පදිංචියෙන් ඉවත් කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
i. මුදල් රෙගුලාසි අංක 504 (1)	දෙපාර්තමේන්තුව විසින් එක් එක් කාර්තුව අවසානයේදී වෙළඳ ණයගැතියන් සහ ණයහිමියන්, නිමි භාණ්ඩ, අමු ද්‍රව්‍ය, ගබඩා භාණ්ඩ හා සැපයුම් සහ අත්තිකාරම් ගිණුම් සඳහා නියමිත සීමාවන් පිළිබඳ ප්‍රකාශයන් පිළියෙල කොට විගණකාධිපතිවරයාටද පිටපතක් සහිතව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.
ii. මුදල් රෙගුලාසි අංක 756 (6) හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛය	පොදු 47 වාර්තාවෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කර 2024 අපහරණ වාර්තාවන් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ)	භාණ්ඩාගාර ලේකම්ගේ අංක MF/CG/02/(iv) හා 2017.06.28 දිනැතිව නිකුත් කර ඇති 01/2017 වත්කම් කළමනාකරණ චක්‍රලේඛය.	වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා රජයේ සියලු මූල්‍ය නොවන වත්කම් ලේඛණගත කිරීම යටතේ කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට යැවිය යුතු මූල්‍ය නොවන වත්කම් වන ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් ඉටු කිරීම සඳහා "ඒ" පංතියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව 1971 ජනවාරි 10 දින ස්ථාපනය කර තිබුණි.

ඒ අනුව නිරසාර සංවර්ධනය තුළින්, ඉදිරි ශ්‍රී ලාංකීය යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ, නිෂ්පාදන, සේවා සහ පුහුණුව සපයන විශිෂ්යතම රාජ්‍ය ආයතනය බවට පත්වීම දෙපාර්තමේන්තුවේ දැක්ම විය. දෙපාර්තමේන්තුවේ කාර්යයන් නිෂ්පාදන ක්ෂේත්‍රය, ඉදිකිරීම් ක්ෂේත්‍රය (බර වැද්දුම්), අළුත්වැඩියා සහ නඩත්තු ක්ෂේත්‍රය සහ යාන්ත්‍රික ඉංජිනේරු උපදේශාත්මක සේවා යන ක්ෂේත්‍රයන් 04 ක් යටතේ විහිදී ඇත.

4.1.2 ව්‍යාපෘති ඉටු නොකිරීම

(අ) සෞඛ්‍ය අමාත්‍යාංශයේ දෙවන මහලෙහි වහලය පිළිසකර කිරීම

සුවසිරිපායෙහි පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශයේ දෙවන මහලේ වහල පිළිසකර කිරීමේදී වඩා අවදානම් සහිත ස්ථාන ගලවා දිරා ගිය කොටස් ඉවත් කර අළුත්වැඩියාව සම්පූර්ණ කර ඇති බවත් එම ප්‍රමාණය එකඟ වූ වැඩ කොටසෙන් සියයට 25 ක් පමණ බවත් සඳහන් කරමින් 2024 නොවැම්බර් 28 දක්වා සිදු කරන ලද වැඩ කොටසට අදාළව රු.3,780,162 ක බිල්පතක් ඉදිරිපත් කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව සියයට 20 ක අත්තිකාරම් මුදලක් ලබා ගත හැකිව තිබියදීත් එසේ ලබා නොගෙන දෙපාර්තමේන්තුව මුදල් යොදවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. වහල අළුත්වැඩියා කිරීම සිදුවන අතරතුර ඇති වූ වර්ෂාවෙන් සිදු වූ හානිය පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් පත්කළ කමිටුව විසින් සිදු කරන ලද මු.රෙ.104 පරීක්ෂණය අනුව රු.1,716,375 ක හානියක් සිදුව ඇති බව තක්සේරු කර තිබුණි. ඉන් රු.429,275 ක් සිවිලිම අළුත්වැඩියා කර දීම වෙනුවෙන් අඩුකොට ඉතිරි රු.1,287,100 ක

මූදල් සිදුව ඇති අලාභය වෙනුවෙන් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු මූදලෙන් අඩුකොට රු.2,115,021 ක මූදල් පමණක් 2025 දෙසැම්බර් 29 දින දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබූ අතර අදාළ අලාභය ගිණුම්ගත කොට නොතිබූ බව අනාවරණය විය.

(ආ) **භූගත විදුලි රැහැන් පද්ධතිය ඉදි කිරීම ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර, ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන සැලසුම් සකස් කර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යාමේදී ඒ සඳහා සකස් කළ රු.23,858,572 ක ඇස්තමේන්තුව තුළ ඇතුළත් රු.8,425,000 ක් වටිනා (35%) ක වැඩ කොටස් ඉටු කිරීම අනවශ්‍ය බව පසුව හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණු අතර මූල් ඇස්තමේන්තුවේ ඇතුළත්කර නොතිබූ, පසුව හඳුනාගත් රු.2,236,800 ක් වටිනා අත්‍යවශ්‍ය වැඩ විෂයයන් විශේෂ ලැයිස්තුගත මිල අනුපාත (SSR - Special Schedule of Rates) යටතේ ඉටු කර නිබුණි. මේ හේතුවෙන් ලංසු ඉදිරිපත් කිරීමේදී මිල තරඟයකට ලක් කර වාසිදායක තත්ත්වයන් ලබාගැනීමට නිබූ අවස්ථා අහිමිව තිබුණු අතර BOQ හි සියයට 35 ක අනවශ්‍ය වැඩ කොටස් ඇතුළත් කර නිබීම නිසා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ මූලික මූලධර්ම උල්ලංඝනය වී නිබුණි.

(ඇ) **රජයේ කර්මාන්ත ශාලාවේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඇස්ෆෝල්ට් කොන්ක්‍රීට් යොදා ඉදිකිරීම පරීක්ෂාව**

කොන්ත්‍රාත් වටිනාකම රු.7,560,525 කට 2021 ජූලි 05 දින ගිවිසුම්ගත මෙම ව්‍යාපෘතියට අනිවාර්ය කාර්ය මණ්ඩල නිලධාරීන් වන ඇස්ෆෝල්ට් කොන්ක්‍රීට් මාර්ග ඉදිකිරීමේ පලපුරුද්ද සහිත ඉංජිනියර්වරයෙකු හා කාර්මික නිලධාරියෙකු සිටින බවට ලංසු ලේඛන සමඟ ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබූ එම ලංසුකරු පසුව ඒ සම්බන්ධයෙන් නීති මාර්ගයට යොමු වෙන බව පවසමින් ලිඛිත ඉල්ලීමක් කළ පසු, එම නිලධාරීන් ලබා දෙන බවට කැමැත්ත ලබා ගැනීම මත, නැවත එම ආයතනය වෙතම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නිබුණි. මේ හේතුවෙන් 2006 රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් වඩාත් විනිවිදභාවයකින් කටයුතු කිරීම, සාධාරණත්වය, ලංසුකරුවන්ට සමාන අවස්ථා ලබා දීම යන මූලික මූලධර්ම වලට පටහැනිව කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සිදුකර නිබුණි.

මාර්ගය ඉදිකිරීම සඳහා කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවෙන් ලබා ගත් රු.7,707,210 ක කොන්ත්‍රාත්තුව යටතේ, පස් කැපීම් සහ ABC පිරවීම් ප්‍රමාණය සත මීටර් 300 සිට 538.25 දක්වා වැඩිවීමේදී සමස්ත විවලතාවය සියයට 19 ක්ව පැවති නමුත්, තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ පරිදි සියයට 10 කට වඩා ඉහළ වූ එම විචලතාවය සඳහා අමාත්‍යාංශ අනුමැතියකින් තොරවම 2021 දෙසැම්බර් 31 දින ගෙවීම් අනුමත

කර තිබුණි. එසේම, මීටර 473 ක් වූ මාර්ගයේ මීටර් 20 පරතරයකින් පයිප්ප එළීම සඳහා යෙදිය යුතු පයිප්ප 23 ක් වුවද, රු.1,300,000 ක් වැය කරමින් පයිප්ප 25 ක් ඇස්තමේන්තු කර තිබූ අතර, පසුව එම ඇස්තමේන්තුවද ඉක්මවා යමින් තාක්ෂණික ඇගයීම් කමිටුවේ හෝ ප්‍රසම්පාදන කමිටුවේ කිසිදු අනුමැතියකින් තොරව අමතර වැඩ යටතේ තවත් බට 9 ක් එළීම වෙනුවෙන් රු.468,000 ක අමතර මුදලක් ගෙවා තිබුණි.

ආයතන පරිශ්‍රයේ ප්‍රධාන ජල සැපයුම් නලය ඉවත් කර ගැනීමට අදාළ රු.120,000 ක පිරිවැය මුල් ඇස්තමේන්තුවට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් එය අමතර වැඩ යටතේ ගෙවීමට සිදුව තිබූ අතර, මීටර 473 ක් දිගින් සහ මීටර 4 ක් පළලින් යුක්තව මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට සම්පූර්ණයෙන්ම ගෙවීම් කර තිබුණද, සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී, මාර්ගයේ ස්ථාන 12 ක්ම මීටර 3.70 - 3.95 අතර අඩු පළලකින් පැවති බැවින් මාර්ගයේ සාමාන්‍ය පළල මීටර 3.836 ක් දක්වා අඩු වී තිබූ අතර, පිරිවිතරයන්ට බාහිරව සිදුකර ඇති මෙම ඉදිකිරීම් තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘතිය මඟින් බලාපොරොත්තු වූ ප්‍රවාහන අරමුණු ඉටුකර ගැනීමට බාධාවක් වී තිබුණි.

4.1.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද රු.104,412,899 ක් වූ ඇස්තමේන්තුවට තැපැල් දෙපාර්තමේන්තුව එකඟවී 2018 දෙසැම්බර් 31 දින රු.3,795,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද අදාළ ඉදිකිරීමට යෝජිත ඉඩමෙහි පස සුදුසු නොවන බව 2019 ජනවාරි 13 දින පැවති සාකච්ඡාවේදී තහවුරු වී තිබුණු බැවින් අළුතින් සකස් කරන සැලසුමකට අනුව වෙනත් ස්ථානයක ඉදිකිරීමකට යැයි දක්වා තවත් රු.10,710,572 ක් 2019 මාර්තු 14 දින හා රු.7,694,000 ක් 2020 මාර්තු 06 දිනද ලෙස එකතුව රු.22,199,572 ක් තැපැල් දෙපාර්තමේන්තුවෙන් අයකරගෙන තිබුණි. එසේ වුවද 2025 දෙසැම්බර් 31 දිනටද ව්‍යාපෘතියෙහි ප්‍රගතිය සියයට 10 ක් පමණක් විය. වසර 06 ක් ගත වුවද ව්‍යාපෘතිය නිමකර දීමට හෝ ලද මුදල් ආපසු ගෙවීමට හෝ කටයුතු කර නොතිබුණි.

4.1.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උප වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතු බවත්, 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10(2) ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

(අ) රජයේ කර්මාන්තශාලාවේ නිෂ්පාදිත භාණ්ඩ ප්‍රදර්ශණය කිරීම සඳහා කර්මාන්තශාලා ගොඩනැගිල්ල ඉදිරිපස ඉදිකර නිබුණු චර්ග මීටර් 265 කින් යුත් ප්‍රදර්ශණාගාරය ඒ සඳහා උපයෝජය නොකර දීර්ඝ කාලයක සිට වසා දමා නිබූ බව නිරීක්ෂණය විය.

(ආ) කර්මාන්තශාලා භූමියෙහි පිහිටි පැරණි ආපනශාලා ගොඩනැගිල්ල අළුත්වැඩියා කර රාත්‍රී සේවක විවේකාගාරයක් ලෙස භාවිතා කිරීමට කළමනාකරණය විසින් නිර්දේශ කර නිබූ අතර 2023 වර්ෂයේදී අළුත්වැඩියා කටයුතු සඳහා වහලය ගලවා ඉවත් කර නිබුණි. මෙම ගොඩනැගිල්ලෙහි අළුත්වැඩියා කටයුතු 2026 ජනවාරි 16 වගඋන දින වන විටත් ආරම්භ කර නොනිබූ අතර ගොඩනැගිල්ලෙහි බිත්ති වැස්සට තෙමීමෙන් හානියට පත්වෙමින් පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) දෙපාර්තමේන්තුව සතු රු.4,500,000 ක වටිනාකමින් යුතු වාහන 03 ක් 2023 හා 2024 වර්ෂවල සිට ගර්හිත තත්ත්වයේ පැවති අතර අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොනිබුණි.

(ඈ) වටිනාකම රු.2,297,400 ක් වූ යන්ත්‍ර සූත්‍ර අයිතම 16 ක් වර්ෂ 08 ක පමණ කාලයක සිට භාවිතයට නොගෙන පවතින අතර ඉන් වටිනාකම රු.738,400 ක් වූ යන්ත්‍ර සූත්‍ර අයිතම 5 ක් සුළු අළුත්වැඩියාවකින් පසු භාවිතා කළ හැකි තත්ත්වයක පැවතියද එම අළුත්වැඩියා කිරීම් හෝ අවශ්‍ය පරිදි අනෙකුත් අයිතම අපහරණය කිරීමට හෝ කටයුතු කර නොනිබුණි.

4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

මු.රෙ. අංක 880 හි විධිවිධාන ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වවුචර, සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප අඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු බව දක්වා ඇතත් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, සහකාර අධ්‍යක්ෂ (පාලන), සහකාර අධ්‍යක්ෂ (සැලසුම්), ප්‍රධාන ඉංජිනේරු, ඉංජිනේරු, ප්‍රධාන ගණකාධිකාරී, ගණකාධිකාරී, ගබඩා භාරකරු හා රියදුරන් ඇප තැබීම් සිදු කර නොනිබුණි.

4.4 පාඩු හා හානි

වැය විෂයය අංක 1701 යටතේ පාඩු සහ කපා හැරීම් වියදම් ලෙස රු.165,055 ක වෙනස්කමක් ගෙවා නිබූ නමුත් මූල්‍ය ප්‍රකාශනයෙහි ඇමුණුම (i) - පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ එය ඇතුළත් කර නොතිබුණි.

4.5 කළමනාකරණ දුර්වලතා

(අ) රජයේ කර්මාන්තශාලාවේ පැවති පැරණි පරිගණක මෘදුකාංග පද්ධතියෙහි දුර්වලතා හේතුවෙන් අක්‍රමවත්ව ක්‍රියාත්මක වූ තොග පාලනය, තොග ඇණවුම් කිරීම, මිලදී ගැනීම්, ඇස්තමේන්තු සැකසීම් ආදී කටයුතු නිසියාකාරව ක්‍රියාත්මක කිරීම සඳහා පැවති පද්ධතිය වැඩි දියුණු කිරීම වෙනුවෙන් 2021 වර්ෂයේදී මිල ගණන් කැඳවා පුද්ගලික ආයතනයක් වෙත රු.2,954,700 ක් 2021 දෙසැම්බර් 31 දින ගෙවා නිබුණි. පරිසණක මෘදුකාංග පද්ධතිය මඟින් යලි ඇනවුම් මට්ටමේදී ගබඩා ඇනවුම ස්වයංක්‍රියව ලබාගැනීමේ පහසුකම තිබියදී ඒ වෙනුවට අතින් ලියන ලද ගබඩා ඇනවුම්, මිලට ගැනුම් අංශයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) වැඩ තහනමට ලක්ව තිබූ නිලධාරියෙකුගෙන් වර්ෂ 16 කට වැඩි කාලයක සිට අයවිය යුතු රු.142,650 ක ණය ශේෂයක් සහ සේවය අතහැර ගිය නිලධාරීන් 13 දෙනෙකුගෙන් වර්ෂ 1- 20 ත් අතර කාලයක් තුළ අයකර නොගත් රු.959,588 ක ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තු කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.49,208,850 ක් හා පාලන ගිණුමේ ශේෂය රු.49,370,190 ක් වූයෙන් රු.161,340 ක වෙනසක් තිබුණි. එම වෙනස හඳුනාගෙන හේතු දක්වා නොතිබුණි.

(ඈ) විශ්‍රාම ගිය නිලධාරීන් 17 දෙනෙකුගෙන් රු.2,185,384 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයකර ගත යුතුව තිබුණු අතර ඉන් එකතුව රු.420,905 ක් වූ දැනට සේවයේ යෙදී සිටින නිලධාරීන් 04 දෙනෙකුගේ හිඟ ණය මුදල් වර්ෂ 20 කට වැඩි කාලයක සිට අයවිය යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

5. තිරසර සංවර්ධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිශ්චිතව තිරසර සංවර්ධන අරමුණු හා ඊට අදාළ දර්ශක හඳුනා ගැනීමට හා ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය සහතත්‍ය කාර්ය මණ්ඩලය

2025 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය තුළ පුරප්පාඩු වී ඇති තනතුරු 510 ක පුරප්පාඩු පිරවීමට හෝ අවශ්‍යතාවයන්ට අනුව තනතුරු සංඛ්‍යාව සංශෝධනය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු අතර එම පුරප්පාඩු අතුරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවන ප්‍රධාන ඉංජිනේරු තනතුරු 05 ක්ද, නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ, යාන්ත්‍රික ඉංජිනේරු, විදුලි ඉංජිනේරු, සිවිල් ඉංජිනේරු හා නීති නිලධාරි යන තනතුරු හා තෘතීයික මට්ටමේ තනතුරක්වන ප්‍රධාන සැලසුම් ශිල්පි තනතුර 2016 අප්‍රේල් 06 දින සිට එනම්, තනතුරු අනුමත කරන ලද දින සිටම පුරප්පාඩුව පැවතීම, දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු සඳහා ඍජුව බලපා තිබුණි.

ටී.ඩී.සිතා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
කළ වැඩ අත්තිකාරම්			√
ප්‍රාග්ධන වියදම්			√

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
SDG 4 - ගුණාත්මක අධ්‍යාපනය (රැකියා සඳහා අවශ්‍ය තාක්ෂණික හා වෘත්තීය කුසලතා ඇති පුද්ගලයින් බිහි කිරීම)	100%	• වාර්ෂිකව පුහුණු ලාභීන් 30 ක් පුහුණු කිරීම			√
SDG 8 - යහපත් රැකියා සහ ආර්ථික වර්ධනය (කාර්මික ඵලදායීතාවය වැඩි කිරීම)	100%	• නිෂ්පාදන ඵලදායීතාවයේ වර්ධනය (නවීන තාක්ෂණයෙන් යුත් යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන රු. මි 29 ක් වියදම් කිරීම)			√
SDG 9 - කර්මාන්ත, නවෝත්පාදන හා යටිතල පහසුකම් (ඉංජිනේරු පර්යේෂණ හා නවෝත්පාදන කටයුතු සිදු කිරීම)	100%	• පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන රු. මි 2 වියදම් කිරීම			√
SDG 12 – වගකීමෙන් යුතු පරිභෝජනය හා නිෂ්පාදනය (අමුද්‍රව්‍ය අපතේ යාම අවම කිරීම හා ප්‍රතිචක්‍රීකරණය කිරීම)	100%	• 300 Kg ආසන්න ලෝහ සුන්බුන් ප්‍රතිචක්‍රීකරණය කිරීම		√	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- නවෝත්පාදනයක් සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීම.
- ලේසර් වෙල්ඩින් යන්ත්‍ර ආදී නවීන තාක්ෂණයෙන් යුත් යන්ත්‍ර භාවිතය මගින් නිෂ්පාදනය ඵලදායීතාවය ඉහල නංවා ගැනීම.
- ලේසර් කැපුම් යන්ත්‍ර භාවිතා කිරීම මගින් අමුද්‍රව්‍ය නාස්තිය අවම කර ගැනීම.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	31	20	11
තෘතියික	10	01	09
ද්විතියික	296	104	192
ප්‍රාථමික	445	147	298
එකතුව	**782**	**272**	**510**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය / අතිරික්තයේ බලපෑම

- ප්‍රාථමික ශ්‍රේණිවල කාර්ය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව 445 ක් වන අතර 298 ක පුරප්පාඩු සංඛ්‍යාවක් පවතී.
- ද්විතික ශ්‍රේණිවල නිලධාරී ඌණතාවය හේතුවෙන් විෂයන් කීපයක් භාර දී ඇත. එහිදී ඒ ඒ කාර්යයන්හි කාර්යක්ෂමතාවයට බලපෑම් සිදු වී ඇත.
- එකවර ව්‍යාපෘති කීහිපයක කටයුතු කිරීමට සිදුවීමෙදි, කාර්ය මණ්ඩල ඌනතාවය, මහත් බලපෑම් ඇති කරයි.
- පවත්නා නිෂ්පාදන කාර්යයන්ට හා ප්‍රාථමික ශ්‍රේණිවල නිලධාරීන්ට වැටුප් හා වේතන ගෙවනු ලබන්නේ දෙපාර්තමේන්තු කළ වැඩ අත්තිකාරම් ගිණුමෙන් වන බැවින් එම මූල්‍ය ශක්තිය ද සලකා බලා බඳවා ගැනීම් කරනු ලැබේ.

6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වූ ආකාරය 2025

අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)	පුහුණු කිරීම් වර්ගය (දේශීය,විදේශීය)	පුහුණුවෙන් පසු ලබා ගත් දැනුම
1.	වෘත්තීය ආරක්ෂාව	113	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
2.	ලෝහ නිෂ්පාදනය -I	96	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
3.	ලෝහ නිෂ්පාදනය -II	101	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
4.	වාහන නඩත්තුව	95	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
5.	එක්දින පෑස්සුම් වැඩමුළුව	02	දින 01	0.00	දේශීය	සතුටුදායකයි
6.	Information Session on JICA Training on KCCP / Short Term & Long Term Programmers	02	01	0.00	දේශීය	සතුටුදායකයි

2025 වර්ෂය සඳහා පුහුණු වැඩසටහන් වෙනුවෙන් මිලියන 2.0ක ප්‍රතිපාදන අනුමත වී තිබූ අතර වැය ශීර්ෂ 310-2-1-0-2401 යටතේ 2025 වර්ෂයේ පහත පරිදි ප්‍රතිපාදන මිලියන 2.0න් 80%ක ප්‍රමාණයක් වියදම් සිදු කරන ලදි.

අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)	පුහුණු කිරීම් වර්ගය (දේශීය,විදේශීය)	පුහුණුවෙන් පසු ලබා ගත් දැනුම
01.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	1	දින 10	30,000.00	දේශීය	සතුටුදායකයි
02.	සිවිල් විශ්‍රාම වැටුප් ගණන් බැලීම් හා ගෙවීම් පිළිබඳ පුහුණුව	1	දින 02	13,000.00	දේශීය	සතුටුදායකයි
03.	ලිපිගොනුකරණය හා රාජකාරී ලිපි සම්පාදනය පිළිබඳව එක් දින පුහුණු වැඩසටහන	27	දින 01	65,000.00	දේශීය	සතුටුදායකයි
04.	රියදුරන් සහ කාර්යාල කාර්යය සහායකයින් සඳහා විනය හා කාර්යාලයීය ආචාර විධි	1	දින 02	13,000.00	දේශීය	සතුටුදායකයි
05.	Public Procurement Procedures & Practices	2	දින 01	54,000.00	දේශීය	සතුටුදායකයි

06.	Public Procurement Procedures & Practices	2	දින 01	38,400.00	දේශීය	සතුටුදායකයි
07.	Advanced Corrosion Protection Techniques: Hot dip Galvanizing & Beyond	4	දින 01	60,000.00	දේශීය	සතුටුදායකයි
08.	හානි පාඩු මු.රෙ. 104 යටතේ වූ පරීක්ෂණය	1	දින 01	6,500.00	දේශීය	සතුටුදායකයි
09.	නිවාඩු භාර නිලධාරියාගේ කාර්යය භාරය හා වගකීම	3	දින 01	19,500.00	දේශීය	සතුටුදායකයි
10.	In-House Awareness Programme on ISO 9001:2015 Standard Requirements 01 Day	30	දින 01	121,025.52	දේශීය	සතුටුදායකයි
11.	Process mapping and simulation modeling	02	දින 04	128,000.00	දේශීය	සතුටුදායකයි
12.	Introduction to Artificial Intelligence	01	පැය 40	41,000.00	දේශීය	සතුටුදායකයි
13.	කාර්යාල ක්‍රම පුහුණු වැඩසටහන	03	දින 01	36,000.00	දේශීය	සතුටුදායකයි
14.	විද්‍යාත්මක පිරිමැසුම්දායක සහ රිය පැදවීම	01	දින 01	6,000.00	දේශීය	සතුටුදායකයි
15.	Electrical safety and regulation Group 01	06	දින 04	252,000.00	දේශීය	සතුටුදායකයි
16.	Electrical safety and regulation Group 02	06	දින 04	252,000.00	දේශීය	සතුටුදායකයි
17.	කාර්යාල සටහන් ලිවීම හා රාජකාරී ලිපි ලිවීම	03	දින 01	19,500.00	දේශීය	සතුටුදායකයි

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල වේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.9	භාණ්ඩ පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍ර ලේඛ 1-2019ට වැඩිමනක් වශයෙන් DMA/AMC/M/2021/2 හා 2021/08/06 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් ලිපිය අනුව රැස්වීම් පැවැත්වීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 1/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		

09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව, කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
අංකය	**අදාළ කර ගත යුතු අවස්ථාව**	**අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම**	**අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග**
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.		2020 වර්ෂයේ සිට සෑම මසකම ශේෂයන් පරීක්ෂා කර ඒවා පියවා ගැනීමට කටයුතු කරනු ඇත.
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳීම් කිරීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15	**අදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සිමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවස්ථාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධික්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම , ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධන කිරීම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		